# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 42/81.

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1981 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන පනතෙහි 42ඕඕ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 42ඕ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ 42ඕඕ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ඇතැම් වතු ඉඩම්, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනයෙහි ප්‍රසිද්ධ සමාගමකට අයිතිව තිබූ වතු ඉඩම් ලෙස සලකනු ලැබිය යුතු බව.

42ඕඕ. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තියෙහි හෝ මේ පනතේ ඉහතින් වූ විධිවිධානවල හෝ පටහැනිව කුමක් සඳහන් ව ඇත ද (ප්‍රසිද්ධ සමාගමක් වූ හෝ පෞද්ගලික සමාගමක් වූ) යම් සමාගමකට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනතේ කාර්ය සඳහා පවත්නා සමාගමක් ලෙස පිළිගනු ලැබූ සමාගමකට හෝ සමාගම් ආඥාපනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමකට හෝ, ශ්‍රී ලංකාවෙන් පිටත ලියා පදිංචි කරන ලද හෝ සංස්ථාගත කරන ලද සමාගමක් විසින් 1974 ජූනි මස 19 වන දින හෝ එදිනට පසුව පවරන ලදුව, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනයේ දී පළමු කී සමාගමට අයිතිව තිබූ නැතහොත් සන්තකව තිබූ සෑම වතු ඉඩමක් ම, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනයෙහි ප්‍රසිද්ධ සමාගමකට අයිතිව තිබූ හෝ සන්තකව තිබූ වතු ඉඩමක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ සෑම වතු ඉඩමක් ම මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනයේ දී කොමිෂන් සභාව සතු විය යුතු ය.".

2 වන වගන්තිය අතීතයටත් බල පෑ යුතු බව.

3. (1) මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියෙහි කරන ලද සංශෝධනය 1975 ඔක්තෝබර් මස දහ හත් වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක හෝ යම් අභියාචනයක්, නඩුවක්, ඉල්ලීමක් හෝ වෙනත් නඩු කටයුත්තක් (එම අභියාචනය, නඩුව, ඉල්ලීම හෝ නඩු කටයුත්ත මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙර හෝ පසුව ඉදිරිපත් කර හෝ පවරා තිබුණ ද) විභාග කිරීමේ දී යම් වතු ඉඩමක් කොමිෂන් සභාව වෙත සතු වූයේ ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නැගී අවස්ථාවක නැතහොත් වතු ඉඩම් සම්බන්ධයෙන් වෙනත්

කාරණයක් පැන නැඟී අවස්ථාවක, ඒ ප්‍රශ්නය හෝ කාරණය මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව තීරණය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 2 වන වගන්තිය ක්‍රියාත්මක වීමේ හේතුවෙන් යම් වතු ඉඩමක් කොමිෂන් සභාව වෙත සතු වී, ඒ වතු ඉඩම කොමිෂන් සභාව වෙත සතු වීමට පෙර එහි අයිතිකරුව සිටි තැනැත්තා විසින්, මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ඒ වතු ඉඩම වෙනුවෙන් ලැබීමට හෝ අත්කර ගැනීමට කොමිෂන් සභාවට හිමිකම ඇති යම් මුදල්, ලබා ගෙන හෝ අත්කර ගෙන ඇති අවස්ථාවක, ඒ මුදල්, මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පටගැනිව කුමක් සඳහන් ව ඇත ද, ඒ වතු ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු වන්දියෙන් අඩු කර ගනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ—

"ප්‍රධාන ප්‍රඥප්තිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදහස් වේ; තව ද

"කොමිෂන් සභාව" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතින් පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.